ADVANCED LEVEL

# Economics

## PAPER 01

A

සිහිනයේ යථාර්තය....



ආර්ථික විද්‍යාවේ මානව සම්පත

ක්‍රිෂාන්ත කුමාර

krishantha kumara krishantha kumarasKrishantha
Krishantha kumara krishantha kumara krishantha kumarasKrishantha kumara Krishantha

01. ආර්ථිකය තුළ ආණ්ඩුවේ මැදිහත්වීම වැඩිම වශයෙන් දක්නට ලැබෙන්නේ,

i. ව්ධාන ආර්ථිකයක ය. ii. මිශ්‍ර ආර්ථිකයක ය.
iii. වෙළඳපොළ ආර්ථිකයක ය. iv. සාම්ප්‍රදායික ආර්ථිකයක ය.
v. සමාජයීය වෙළඳපොළ ආර්ථිකයක ය.

02. කිසියම් කල්පිත ආර්ථිකයකට අදාල නිෂ්පාදන හැකියා වක්‍රයක් රූප සටහනෙහි දක්වේ. එහි x ලක්ෂ්‍යයේදී ආහාර නිෂ්පාදනය කිරීමේ ආවස්ථික පිරිවැය




i. තීරණය කළ නොහැකි වේ.
ii. ආහාර නිෂ්පාදනය තව දුරටත් වැඩි කළ නොහැකි බැවින් අපරිමිත වේ.
iii. රෙදි නිෂ්පාදනය කිරීමේ ආවස්ථික පිරිවැයට වඩා විශාල වේ.
iv. රෙදි නිෂ්පාදනය කිරීමේ ආවස්ථික පිරිවැයට වඩා අඩුවේ.
v. ශූන්‍ය වේ.

03. නිෂ්පාදන සාධකයක් වශයෙන් ප්‍රාග්ධනය උදාහරණයක් නොවෙනුයේ පහත සඳහන් දෑ අතුරෙන් කවරක්ද?

i. කාර්යාල ගොඩනැගිල්ලක් ii. ට්‍රැක්ටරයක්
iii. බැංකු ණයක් iv. මහා මාර්ගයක්
v. වාරි ජලය ගෙන යන ඇළ මාර්ගයක්

04. කිසියම් භාණ්ඩයක් වෙළඳපොළ සැපයුම් වක්‍රය මෙහි දක්වෙන රූප සටහන මගින් පෙන්නුම් කෙරේ. මෙම සැපයුම් වක්‍රය මත සැපයුමේ මිල නම්‍යතාව නිවැරදි ව විස්තර කෙරෙන ප්‍රකාශය කුමක්ද?




i. සෑම නිමැවුම් ප්‍රමාණයක දී ම ස්ථාවර සහ එකට වැඩි අගයක් ගනී.
ii. සෑම නිමැවුම් ප්‍රමාණයකදීම ස්ථාවර සහ එකට අඩු අගයන් ගනී.
iii. එකට වඩා වැඩි අගයක් ගනු ලබන අතර නිමැවුම වැඩිවෙත් ම අගය අඩු වේ.
iv. එකට වඩා වැඩි අගයක් ගනු ලබන අතර නිමැවුම වැඩිවෙත් ම අගය වැඩි වේ.
v. නම්‍යතාව ඍණ අගයක් ගනු ලබන අතර නිමැවුම වැඩිවෙත් ම අගය අඩු වේ.

05. දේශීය නිෂ්පාදනය සහ ආනයනය යන මූලාශ්‍ර දෙකින් ම සැපයුම තීරණය වනු ලබන කිසියම් භාණ්ඩයකට අදාළ වෙළඳපොළක් මෙහි සඳහන් රූප සටහන මගින් පෙන්නුම් කෙරේ. එහි $S_h$ මගින් දේශීය සැපයුම් වක්‍රයත්, $S_m$ මගින් ආනයන සැපයුම් වක්‍රයත් නිරූපණය කෙරේ. D වෙළඳපොළ ඉල්ලුම් වක්‍රය වේ මෙම වෙළඳපොළ සමතුලිත තත්ත්වයකට පත් වූ විට වෙළඳපොළ මුළු ඉල්ලුම් ප්‍රමාණය සහ මුළු ආනයන ප්‍රමාණය කොපමණද?

| | මුළු ඉල්ලුම් ප්‍රමාණය | මුළු ආනයන ප්‍රමාණය |
|---|---|---|
| i. | OQ | MQ |
| ii. | OQ | OT |
| iii. | OT | MQ |
| iv. | OT | MT |
| v. | OQ | MT |




06. සතියකට බිත්තර 200ක නිෂ්පාදනය කරනු ලබන පූර්ණ තරගකාරී ආයතනයක් බිත්තරයක් රුපියල් 25ක් වෑ. මිලකට අලෙවි කරයි. මෙම බිත්තර 200 සතියකදී නිෂ්පාදනය කිරීමේදී ආයතනය පහත සඳහන් පිරිවැය දරයි.

| | | |
|---|---|---|
| මුළු ස්ථාවර පිරිවැය | = | රුපියල් 2000 |
| මුළු විචල්‍ය පිරිවැය | = | රුපියල් 4000 |
| ආන්තික පිරිවැය | = | රුපියල් 25 |

කෙටිකාලයේදී තම ලාභ උපරිම කිරීමට හෝ අලාභ අවම කර ගැනීමට හෝ ආයතනය කුමක් කළ යුතුද?

i. බිත්තරයක මිල වැඩි කිරීම.
ii. නිෂ්පාදනය වැඩි කිරීම.
iii. නිෂ්පාදනය අඩු කිරීම.
iv. නිෂ්පාදනය වර්ථමාන මට්ටමෙහි පවත්වා ගෙන යාම
v. නිෂ්පාදනය මුළුමනින්ම අත්හිටුවීම.

07. තොග වෙනස්වීම් ඇතුළත් කරනුයේ පහත සඳහන් වියදම් අතුරෙන් කවර වියදම් ගණයකටද?

(i). දළ දේශීය පෞද්ගලික ආයෝජනය (ii). ශුද්ධ අපනයන (iii). රජයේ මිල දී ගැනීම්
(iv). කල්පවත්නා භාණ්ඩ සඳහා කරනු ලබන පෞද්ගලික පරිභෝජන වියදම්
(v). කල් තබාගත නොහැකි භාණ්ඩ සඳහා කරනු ලබන පෞද්ගලික පරිභෝජන වියදම්

08. එක්තරා කල්පිත ආර්ථිකයකට අදාල සාර්ව ආර්ථික දත්ත පෙළක් පහත සඳහන් වගුව පෙන්නුම් කරයි.

| **අයිතමය** | **රුපියල් බිලියන** |
|---|---|
| ඉතුරුම් | 50 |
| ආයෝජනය | 30 |
| බදු අයකිරීම් | 40 |
| අපනයන | 50 |
| ආණ්ඩුවේ මිල දී ගැනීම | 20 |
| ආනයන | 30 |

09. ඉහත තොරතුරුවලට අනුව මෙම ආර්ථිකය අදාළ නිවැරදි ප්‍රකාශය කවරක්ද?

i. අයවැය හීගයක් පවතී.
ii. ආර්ථිකය සමතුලිතතාවේ පවතී.
iii. ගෙවුම් ශේෂයේ වර්තන ගිණුමේ හිගයක් පවතී.
iv. කාන්දුවීම් විදීම් වලට වඩා වැඩිය.
v. ආර්ථිකය ප්‍රසාරණය වනු ඇත.

එක්තරා ආර්ථිකයක සමාහාර ඉතුරුම් ශ්‍රිතය රූප සටහන මගින් පෙන්නුම් කෙරේ.මෙම ආර්ථිකයේ වැය කළ හැකි ආදායම වැඩිවන විට ආන්තික ඉතුරුම් නැඹියාවට සහ සාමාන්‍ය ඉතුරුම් නැඹියාවට කුමක් සිදුවේද?




| | **MPS** | **APS** |
|---|---|---|
| i. | නොවෙනස්ව පවතී. | පහළ වැටේ. |
| ii. | පහළ වැටේ. | ඉහළ නගී. |
| iii. | ඉහළ නගී. | පහළ වැටේ. |
| iv. | ඉහළ නගී. | ඉහළ නගී. |
| v. | නොවෙනස්ව පවතී. | ඉහළ නගී. |

10. ආවෘත ආර්ථිකයක ආන්තික පරිභෝජන නැඹියාව (MPC) 0.8 ක් වේ යැයි සලකන්න. මෙම ආර්ථිකයේ ආයෝජන මට්ටමෙහි ඉහළ යාමක් නිසා ජාතික ආදායම රුපියල් බිලියන 250කින් වැඩි වේ. අනිකුත් කරුණු නොවෙනස් ව පවතී නම් ආයෝජන මට්ටමෙහි ඉහළ යාම කොපමණ ප්‍රමාණයක් වූයේද?

i. රුපියල් බිලියන 20
ii. රුපියල් බිලියන 50
iii. රුපියල් බිලියන 150
v. රුපියල් බිලියන 200
v. රුපියල් බිලියන 250

01. i. වෙළඳපොළ ආර්ථිකයක (නිදහස් ව්‍යවසාය ආර්ථිකයක) ලක්ෂණ මොනවාද?

ii. වෙළඳපොළ ක්‍රමයක මිල මගින් ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යයන් මොනවාද?

iii. නැගී එන වෙළඳපොළ ආර්ථිකයක් යනු කුමක්දැයි පැහැදිලි කොට වෙළඳපොළ ආර්ථිකය කෙරෙහි බලපෑමක් ඇතිකර හැකි උපකරණ පැහැදිලි කරන්න.

iv. සමාජය සතු සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබාගැනීමට අත්කරගත යුතු ඉලක්කයන් මොනවාද?

v. පූර්ණ සේවා නියුක්තිය සහ පූර්ණ නිෂ්පාදනය අතර වෙනස පැහැදිලි කරන්න.

02. i. ඉල්ලුම් න්‍යායේ නිරූපිත මිල ප්‍රතිවිපාකය යන්නෙන් ඔබට වැටහෙන්නේ කුමක්ද? මිල ප්‍රතිවිපාකය කෙරෙහි බලපාන සාධක මොනවාද?

ii. ආදායම් ඉල්ලුම් නම්‍යතාවයේ ප්‍රායෝගික වැදගත්කම් මොනවාද?

iii. ආර්ථික බද්ධ කුලී සහ සංක්‍රාම ඉපැයීම අතර වෙනස පැහැදිලි කරන්න.

iv. ආන්තර බද්ධ කුලී සහ ආරූඪ බද්ධ කුලී යන්නෙහි අර්ථය පැහැදිලි කරන්න.

v. ඉල්ලුම් මිල නම්‍යතාවය තීරණය කරන ප්‍රධාන සාධක කවරේද ?

03. i. හීන වන ඵල සහ අඩුවන පරිමානු කුල ඵල අතර වෙනස්කම් ඇත්නම් එම වෙනස සඳහන් කරන්න.

ii. පිටාර ගැලීමේ පිරිවැය සහ පිටාර ගැලීමේ ප්‍රතිලාභ සම්බන්ධව රජයේ මැදිහත් වී කළ යුතු ගැළපීම් මොනවාද?

iii. ඒකාධිකාරී වෙළඳපොලක දක්නට ලැබෙන ලක්ෂණ මොනවාද?

iv. ඒකාධිකාරී වෙළඳපොළක් වෙළඳපොලෙන් ඉවත් වීමට බලපාන සාධක මොනවාද?

v. ඒකාධිකාරී වෙළඳපොළක ව්‍යාපාර ආයතනයක බාධාකාරී ප්‍රවේශයක් ඇත්තේ ඇයි?

04. i. සාර්ව ආර්ථික උද්ධමනාත්මක පරතරය හා අවධමනාත්මක පරතරය වශයෙන් සළකන්නේ කුමක්ද? එවැනි තත්වයක් ඇති වන්නේ කෙසේද?

ii. සාර්ව ආර්ථික කාරක යන්නෙහි අර්ථය පැහැදිලි කරන්න. විවෘත ආර්ථිකයක සාර්ව ආර්ථික කාරකයන් පැහැදිලි කරන්න.

iii. මෙම ආර්ථික කාරකයන් අතර පවත්නා අන්තර් සම්බන්ධතා රූප සටහන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

iv. ජාතික ආදායම ජාතික නිෂ්පාදනය වියදම් ඇස්තමේන්තු එකිනෙක සමාන වන්නේ ඇයි?

v. මූර්ත ජාතික නිෂ්පාදනය සහ මූර්ත ජාතික ආදායම අතර වෙනස පැහැදිලි කරන්න.

05. i. සමාහාර ඉල්ලුම යනු කුමක්ද? විවෘත ආර්ථිකයක සමාහාර ඉල්ලුම තීරණය කරන සාධක මොනවාද?

ii. ජාතික ගිණුම්කරණය යනු කුමක්ද? ජාතික ගිණුම්කරණයේ ඇති ප්‍රයෝජන මොනවාද?

iii. නිෂ්පාදනයේ එකතු කල අගය යටතේ ඇතුළත් කරන දෑ මොනවාද?

iv. රටක ආර්ථික වර්ධනය මැනීම සඳහා එරටෙහි දළ දේශීය නිෂ්පාදිතයෙහි ඇස්තමේන්තු යොදාගත හැකි ආකාර පැහැදිලි කරන්න.

v. පරිසරය කෙරෙහි නිෂ්පාදනයේ බලපෑම ජාතික ගිණුම් විසින් නොසලකා හැර ඇත. මේ ප්‍රකාශය පැහැදිලි කරන්න.